සැලසීනෙ
செலசீனெ
SELACINE

SELACINE TELEVISION INSTITUTE







වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT 2021

ජනමාධ්‍ය අමාත්‍යාංශය
வெகுசன ஊடக அமைச்சு
Ministy of Mass Media

සැලසිනෙ
චිත්‍රපට
SELACINE

SELACINE TELEVISION INSTITUTE

2021

වාර්ෂික වාර්තාව

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා
ජනමාධ්‍ය අමාත්‍යාංශය
කොළඹ 05.

ගරු අමාත්‍යතුමනි,

වාර්ෂික වාර්තාව - 2021

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් සැලසිනෙ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය
කොළඹ 07

පෙළ ගැස්ම

දැක්ම, මෙහෙවර, අරමුණු	05
සභාපතිතුමාගේ සමාලෝචනය	07
ආයතනික තොරතුරු	08
පරිපාලන ව්‍යුහය 2021 හා සම්බන්ධ තොරතුරු	09
මූල්‍ය වාර්තා - 2021	13
මූල්‍ය වාර්තා සඳහා සටහන්	16
ආදායම් ප්‍රකාශය	17
ශේෂ පත්‍රය	18
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	19
මූල්‍ය වාර්තා සඳහා සටහන්	21
2021 වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ විගණකාධිපතිතුමාගේ මතය	28

දැක්ම, මෙහෙවර සහ අරමුණු

මෙහෙවර

නිපුණත්වයෙන් හෙබි වඩාත් නිර්මාණශීලී හා දිරිමත් පුද්ගල සහය භාවිතා කරමින් උපක්‍රමශීලිත්ව මෙන්ම උසස් තලයේ තාක්ෂණය ද නිර්මාණාත්මකව උපයෝගී කරගනිමින් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සඳහා සන්නිවේදන සහ වෙනත් නිර්මාණශීලී ප්‍රචාරාත්මක අනඟි සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ දේශපාලන සංවර්ධනය සඳහා සක්‍රීයව දායක වීම.

දැක්ම

රාජ්‍ය යාන්ත්‍රණයේ සංවර්ධන හා මෙහෙයුම් සහ සියලු ව්‍යාපාර ක්ෂේත්‍රයන්හි ප්‍රවර්ධනයන් නිර්මාණාත්මකව සන්නිවේදනය කිරීම තුළින් ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වීම

අරමුණ

මූල්‍ය තත්ත්වය ඉහළ දැමීම.

වෙළෙඳපොල ලාභය ඉහළ දැමීම.

සේවාලාභී සංස්කෘතිය ඉහළ දැමීම සඳහා වූ උපක්‍රම ක්‍රියාත්මක කිරීම.

ආයතන සේවකයින් සහ නායකයින් වර්ධනය කිරීම.



සභාපතිතුමාගේ සමාලෝචනය

මා සැලසිනෙ රූපවාහිනී ආයතනයේ සභාපති ධූරයට පත්වීමෙන් අනතුරුව ආයතනය විසින් එළිදක්වනු ලබන තෙවැනි වාර්ෂික වාර්තාව මෙය වන අතර, 2021 වර්ෂයට අදාළව පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාවක් ලැබීම සම්බන්ධයෙන් සතුටු වෙමි.

පසුගිය වසර 39 ක කාල පරිච්ඡේදය දෙස හැරී බැලීමේ දී සැලසිනෙ ආයතනය අලෙවි, මූල්‍ය, පරිපාලන, නිෂ්පාදන, ඉසව්, නිර්මාණ යන අංශයන්ගෙන් සැලකිය යුතු පරිදි දක්ෂතා ඔපමට්ටම් කර ගැනීමට හැකි වී ඇත. 2020 වර්ෂයේ දී රු.මිලි 233.8 දී වාර්ෂික ආදායමක් ලබාගත් අතර, එය 2021 වර්ෂයේ දී රු.මිලි 463.2 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

ආයතනයේ අලෙවි කටයුතු නංවාලීමට සෑහෙන කාර්යභාරයක් ඉටු කිරීමට අපේක්ෂා කර ඇති අතර, ඒ සඳහා කාර්ය මණ්ඩලයේ දායකත්වය උපරිමයෙන්ම ලබා ගෙන ඇත. ලේක්හවුස් ආයතනය සමග එක්ව ඉතා වැඩි වටිනාකමකින් ඇති දැන්වීම් ප්‍රචාරණය කිරීමට දායක විය.

රජයේ එකම ප්‍රචාරණ ආයතනය ලෙස සැලසිනෙ ආයතනයට පැවරෙන වගකීම් නිසි ලෙස ඉටුකර ගැනීම තුළින් එක්ව අරමුණු ජය ගැනීම අපගේ අභිලාෂය වේ.



හරිත් ගුණවර්ධන
සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආයතනික තොරතුරු

නාමය

සැලසිනෙ රූපවාහිනී ආයතනය

නීතිමය ස්වරූපය හා අතීත කාර්ය ස්වභාවය

- 1982 පෙබරවාරි 01 දින සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ අධිකාරිත්වය යටතේ ආරම්භ විය.
- 1982 සිට 1989 දක්වා ඉඩම්, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය දැව සංස්ථාවේ මානව හා මූල්‍ය සම්පත් යටතේ මහවැලි කඩිනම් සංවර්ධන වැඩසටහන පිළිබඳ ශ්‍රී ලාංකීය ජනතාව දැනුවත් කිරීමේ කාර්යය සිදුකිරීම.
- 1989 ජනසවිය වැඩසටහනේ ප්‍රචාරාත්මක කාර්යභාරය සිදුකිරීම.
- 1989.08.19 දිනැති අංක 832/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් සැලසිනෙ ආයතනය යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරන ලදී. (මෙය ආයතනය සම්බන්ධව ගැසට් නිවේදනයක් මගින් කරනු ලැබූ පළමු පැවරීමයි)
- 1997.06.09 දිනැති අංක 979/2 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් තැපැල්, විදුලි සංදේශ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2001.12.20 දිනැති 1215/14 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනසන්නිවේදන අමාත්‍යාංශය වෙත පවරන ලදී.
- 2004.04.28 දිනැති 1338/9 දරන අති විශේෂ ගැසට් නිවේදනය තුළින් තොරතුරු හා මාධ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස නම් කරනු ලැබීය.
- 2005/12/08 දිනැති 1422/22 දරන අති විශේෂ ගැසට් නිවේදනයට අනුව ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයට අයත් ආයතනයක් ලෙස ස්ථාපිත කරනු ලැබීය.
- 2007 අංක 07 දරන සමාගම් පනතෙහි විධිවිධානයන්ට අනුව පූර්ණ අයිතිය රජයට හිමි පොදු සමාගමක් බවට පත්කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත 2008. 03. 26 දිනැති සන්දේශය ඉදිරිපත් කෙරුණි.

ආයතනික කාර්ය භාරය

- රජයේ මාධ්‍ය ප්‍රචාරණ හා නිෂ්පාදන ආයතනය ලෙස ක්‍රියාත්මක වීම.
- 2005. 05. 16 දින අංක 1380/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් පහත සඳහන් කරුණු කාර්ය විෂය පථයට ඇතුළත් කෙරුණි.
    - i. මුද්‍රිත / විද්‍යුත් මාධ්‍ය දැන්වීම් නිෂ්පාදනය
    - ii. රජයේ සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ප්‍රචාරක කටයුතු
    - iii. රජයේ ප්‍රචාරක වැඩසටහන් නිෂ්පාදනය
- 2008.12.02 දිනැති ජනමාධ්‍ය හා තොරතුරු ගරු අමාත්‍යතුමාගේ සංදේශය සම්බන්ධ නිරීක්ෂණයෙන් අනතුරුව 2008.12.24 දිනැති අංක 08/2253/338/043 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් සියලුම අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති ආයතනවල සියලුම වෙළෙඳ දැන්වීම් හා ප්‍රචාරාත්මක වැඩසටහන් සැලසිනෙ රූපවාහිනී ආයතනය මගින් ඉටුකරවා ගැනීම අනිවාර්ය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී.
- රූපවාහිනී වාර්තාමය වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම රූපවාහිනී හා ගුවන් විදුලි වෙළෙඳ දැන්වීම් යනාදී ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් නිෂ්පාදනය කිරීම
- විවිධ වූ පුවත්පත් දැන්වීම් නිර්මාණය මෙන්ම එම දැන්වීම් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්හි උපලේඛනගත කිරීම.
- ඉසව් කළමනාකරණය හා මුද්‍රණ කටයුතු.

පරිපාලන ව්‍යුහය - 2021

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

දේශබන්දු අමිල මොරේමඩ	- සභාපති	(2020.12.17 - 2021.12.29)
එච්.එම් මංජුල හේරත්	- සාමාන්‍යාධිකාරී	

කළමනාකරණය

කානේෂි දහනායක	- කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන - වැ.බ)
සුනන්ද වීරසිංහ	- කළමනාකරු (ශ්‍රව්‍ය/දෘෂ්‍ය) නිෂ්පාදන
මලීන් ධනුෂ්ක	- පාරිභෝගික අධ්‍යක්ෂ
නලින් අලහකෝන්	- කළමනාකරු (මාධ්‍ය)
සුඛිත අකලංක ප්‍රනාන්දු	- ගණකාධිකාරී (වැ.බ)
සුපිත් පුෂ්පකුමාර	- කළමනාකරු (ග්‍රැෆික්)
ප්‍රභාත් කහදුවආරච්චි	- කළමනාකරු (ඉසව්)
ඉන්දික විජේතුංග	කළමනාකරු (මිලදී ගැනීම් හා සැපයුම්)

විගණක

රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව

බැංකුකරුවන්

ලංකා බැංකුව

මහජන බැංකුව

සම්බන්ධීකරණ තොරතුරු

ලිපිනය	-	අංක. 380/57, සරණ පාර, කොළඹ 07
දුරකථන	-	011-4320777, 011-4061586
ෆැක්ස්	-	011-2058229
විද්‍යුත් තැපෑල	-	selacine@gmail.com
වෙබ් අඩවිය	-	www.selacine.lk

නිර්මාණ සහ ග්‍රැෆික් අංශය

ග්‍රැෆික් නිර්මාණකරණය තරඟකාරී වෙළඳ ප්‍රචාරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අංශයකි. අප ආයතනයේද ග්‍රැෆික් නිර්මාණ අංශය එවැනිම සුවිශේෂී කාර්යභාරයක් සිදුකරනු ලබයි. අප ආයතනයේ සියලුම අංශ, විශේෂයෙන්ම අලෙවි අංශය, සියලුම රාජ්‍ය, අර්ධරාජ්‍ය හා පුද්ගලික අංශයන් හි ආයතනයන්ගේ සියලුම ප්‍රචාරණ කටයුතු සඳහා අප අංශයේ සම්පූර්ණ දායකත්වය නොමසුරුව ලබා දෙනු ඇත. ඒ අනුව අප අංශය ගතවූ කාලය තුළ ආයතනයේ සියලුම අංශයන්හි හා ආයතනයේ සාර්ථකත්වය පිටුපස සිට නිහඬ කාර්යභාරයක නියැලී සිටී.

අප අංශයට ප්‍රචාරණ දැන්වීම්, පුවත් පත් දැන්වීම්, බිල්බෝඩ්, අත්පත්‍රිකා, ප්‍රදර්ශන කුටි, වාර්ෂික වාර්ථා ඇතුළු නිර්මාණ කාර්යයන් රැසක් දෛනිකව පැමිණෙන අතර, නව තාක්ෂණයත් සමග මුසුකර නිර්මාණශීලීව නව ලොවට ගැලපෙන පරිදි යාවත්කාලීන වෙමින් අප ආයතනයේ ගමන්මගට උපරිම ශක්තිමත් බවින් අප අංශයේ කාණ්ඩායම සාමූහිකව උරෙන් උර ගැටෙමින් සිය උපරිම දායකත්වය ලබා දෙනු ඇත.

අප අංශයේ කාර්ය භාරය කාර්යාල වේලාවන් තුළ පමණක් සිදු නොවන අතර, ඉන් පරිබාහිරවද ක්‍රියාත්මක වනු ඇත. පසුගිය කොවිඩ් වසංගත කාලය තුළ අප සහෝදර කැළ උපරිම ශක්තිය යොදවමින් සියලුම අංශයන්හි සම්බන්ධීකරණයෙන් ආයතනයට ලැබුණු මුද්‍රිත හා සමාජ මාධ්‍ය හරහා සිදුකළ යුතුව තිබූ සියලුම කාර්යයන් නොපිරිහෙලා ඉටුකරන ලදී. එසේ කිරීම හේතුවෙන් ආයතනයේ දියුණුව කරා ගමන්කළ යුතුව තිබූ ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට සාමූහිකව ක්‍රියා කිරීමට හැකිවිය.

අක්‍රීයව තිබූ හා පාඩු ලබමින් තිබූ අධිවේගී මුද්‍රණ අංශය අප ග්‍රැෆික් අංශයට අනුයුක්ත කිරීමෙන් පසු කාර්යක්ෂමතාව හා ලාභ ලබන තත්වයකට පත් කර, නව සේවාදායකයින් වැඩිකර ගැනීමට අප හට හැකි විය.

අප අංශයේ 3D නිර්මාණ කරණ දක්ෂයන් ද සිටී නිසාවෙන් අපගේ සේවාදායකයින්ගේ අවශ්‍යතාවයට සරිලන පරිදි ආදර්ශ ඉදිරිපත් කිරීම නිසා ඔවුන් ඉන් තෘප්තිමත්භාවයට පත්ව නිර්මාණ කටයුතු සියල්ල පාහේ අප ආයතනය හරහා සිදුකරවා ගැනීමට යොමුවූ බව ඉතා සතුටින් දන්වනු කැමැත්තෙමි.

නව පරිපාලනයේ නව්‍ය කරණයෙන් ඉදිරි දැක්ම සඳහා අප අංශයද අත්වැල් බැඳගනිමින්, ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා උපරිම දායකත්වය ලබා දීමට සැදී පැහැදී සිටින අතර, ආයනයේ උනන්තිය උදෙසා අප අංශයේ දායකත්වය නොපිරිහෙලා ලබාදෙන බව දක්වනු කැමැත්තෙමි.

මාධ්‍ය අංශය

මාධ්‍ය අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වන විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන් හී දැන්වීම් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ උපලේඛනගත කිරීම් සහ සමාජ මාධ්‍යයන්හි ප්‍රචාරයන්ය. එය සෑම වර්ෂයකම වැඩිම ආදායම් උපදවන්නේ මාධ්‍ය අංශයේ උපලේඛනගත කිරීම් තුළිනි. ඒ අනුව 2021 වර්ෂයේද වඩාත් කාර්යක්ෂමව සිදුකරන ලදී. මෙහිදී සමස්ත ආයෝජනය රු. මිලියන 155.4 කි.

2021 වර්ෂය ද කොවිඩ් වසංගත තත්වය හමුවේ ආයතනය වරින් වර වසා තැබීමට සිදු උවද, අප ලබා ගත් මෙම ආදායම වඩාත් ප්‍රශස්ථ මට්ටමක තිබෙන බවට අපගේ හැඟීමයි. මෙහිදී 2020 වර්ෂයේදී මෙන්ම 2021 වර්ෂයේද දැන්වීම් උපලේඛනගත කිරීම් යම් අවස්ථාවන් වලදී නිවසේ සිට සිදුකිරීමට සිදුවිය. පෙර වර්ෂය වගේම එහිදීද අපගේ ඉහළ කළමනාකාරිත්වය විසින් ඒ සඳහා විශාල සහයෝගයක් මාධ්‍ය අංශය වෙත ලබාදෙන ලදී

තවද රූපවාහිනී හා ගුවන්විදුලි උපලේඛනගත කිරීම් සඳහා අප වෙත විශේෂ වට්ටම් ප්‍රතිශතයක් ලැබෙන අතර, මීට අමතරව වර්තමානය වන විට සමාජ මාධ්‍ය ජාලා වෙබ් අඩවී තුළ ප්‍රචාරන කාර්යයන් සිදු කිරීම ඉතාමත් ආකර්ෂණීය අංගයක් බවට පත්ව ඇත. ඒ අනුව අපගේ මාධ්‍ය අංශයෙහි සමාජ මාධ්‍ය අංශයක් වෙනම ඇත. එහිදී අපගේ නිර්මාණාත්මක කාර්යයන් ප්‍රචාරනය කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙලේ දැන්වීම් ප්‍රචාරන නියෝජිත ආයතනයක් ලෙස අපගේ නිර්මාණ කාර්යයන් පමණක් නොව ප්‍රචාරණයේ ඉහළ මට්ටමේ හැකියාවන් සැලසිනෙ සතු බව මෙයින් පෙන්නුම් කෙරේ.

අලෙවි හා පාරිභෝගික සේවා අංශය

මෙම වර්ෂය තුළ ඇති වූ වසංගත රෝග තත්වය හමුවේ අපගේ මූලික අලෙවි ඉලක්කයන් සංශෝධන කිරීමට සිදු වූ අතර, එම තත්වයන් හමුවේ වුවද රුපියල් මිලියන 463.2 කි. අලෙවි ආදායමක් වාර්තා කිරීමට හැකි විය. වර්ෂයෙහි අවසාන මාස කිහිපය තුළ අලෙවි ආදායමෙහි යම් වර්ධනයක් දැකිය හැකි විය.

මානව සම්පත් හා පරිපාලන අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ අනාගත අරමුණු සාක්ෂාත් කර ගනු වස් ශ්‍රම බලකාය ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කොවිඩ් අභියෝගය හමුවේ 2021 වර්ෂයේ සිදුකරනු ලැබූ මානව සම්පත් අංශයේ මෙ පහතින් දක්වා ඇත.

- ශ්‍රම බලකාය වෙත නිවැරදි නායකත්වයක් ලබාදීම අරමුණු කොට ගෙන ආයතනයේ කළමනාකරුවන් සඳහා දෙදින නායකත්ව පුහුණු වැඩමුළුවක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම
- ආයතනයේ අලෙවි කණ්ඩායමේ කුසලතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් ඔවුන් අලෙවි ඉලක්කයන් සපුරා ගැනීමට මෙහෙයවීම
- වෘත්තිය ප්‍රගමනය සඳහා නිලධාරීන්ගේ පෞද්ගලික ඉල්ලීම් පරිදි විෂයානුබද්ධ පාඨමාලා සඳහා මූල්‍යමය අනුග්‍රාහකත්වය ලබාදීම සිදුකර ඇත
- ආයතනයේ සේවකයන්ගේ කාර්යසාධනය සහ සිය රාජකාරී වෙනුවෙන් සිදුකරනු ලැබූ කැපවීම අගය කරනු වස් වරින් වර ඔවුන් වෙත දිරි දීමනා ලබාදීම
- කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය මැන බැලීම තුලින් සේවය සඳහා වන අභිප්‍රේරණය වැඩි කිරීමට පියවර ගෙන ඇත. මේ සඳහා කොන්ත්‍රාත් සේවකයන්ගේ සේවා දිගු ලබාදීමේදී මූලික කාර්යසාධන නිර්ණායක (KPI) මැන බැලීමට කටයුතු කරන ලදි.
- කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් සේවකයන් සේවා මුර ක්‍රමයක් යටතේ සේවයට කැඳවීම හා සියලුම සේවකයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම
- කොවිඩ් වසංගතය හමුවේ වුවද සියලුම සේවකයන්ගේ වැටුප්, අතිකාල හා යැපීම් දීමනා නියමිත පරිදි ගෙවීමට කටයුතු කර ඇත.
- වෙනත් වර්ෂයන්හිදී මෙන්ම සේවකයන් සඳහා සෞඛ්‍ය රක්ෂණාවරණයද ක්‍රියාත්මක කොට ලබාදීමට කටයුතු කරන ලදි.

නිෂ්පාදන අංශය

සැලසිනෙ ආයතනයේ ක්‍රියාකාරී හදවත ලෙස නිෂ්පාදන අංශය හැඳින්වීම වඩාත් ගැලපේ. රජයේ සංවර්ධන ව්‍යාපෘතීන් ජනගත කිරීම සඳහා වාර්තා වැඩසටහන් ප්‍රචාරක දැන්වීම් සකස් කිරීමේ කාර්යය ආරම්භයේ දී අප අංශය වෙත පැවරී තිබූ කාර්යයන් විය. ගතවූ 40 වසරක කාලය තුළ නිෂ්පාදන අංශය වඩාත් සක්‍රිය ලෙස සැලසිනෙ ආයතනයේ වෙළෙඳ දැන්වීම් නිර්මාණය, වාර්තා වැඩසටහන්, රූපවාහිනී නාට්‍ය නිර්මාණයේ යෙදෙමින් ඉදිරි පියවර ගණනාවක් තැබීමට සමත්ව සිටී. එමෙන්ම රජයේ කාලීන අවශ්‍යතා අනුව නූතන තාක්ෂණය ඔස්සේ තරඟකාරී ලෙස ගුණාත්මක තත්ත්වයෙන් උසස් වැඩසටහන් නිර්මාණශීලීව නිෂ්පාදනය දක්වා දිගු පියවර රැසක් දැනටමත් තබා අවසන්ය.

2021 වසරේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංගණන කාර්යය අප ආයතනය සමග එක්ව කටයුතු කිරීමට හිවිසුම්ගත වූ අතර එහි මූලික ප්‍රචාරණ දැන්වීම් රැසක් නිර්මාණය කර අවසන් කිරීමට අපි කටයුතු කලෙමු.එම කාර්යය 2023 වසර දක්වා තවදුරටත් ක්‍රියාත්මක වෙමින් පවතී. ජාතික ලොතරැයි මණ්ඩලයේ ලොතරැයි දිනුම් ඇදීමේ නිෂ්පාදන කාර්යය සාර්ථකව ක්‍රියාත්මක කළ අතර කම්කරු දෙපාර්තමේන්තුව සඳහා ප්‍රචාරක දැන්වීම් සාර්ථක ලෙස නිර්මාණය කරදීමට අපට හැකිවිය.පරිසර අධිකාරියේ වායු දූෂණය වැළැක්වීම ඇතුලු වාර්තා වැඩසටහන් රැසක් ද නිර්මාණය කරමින් ආයතනයේ සාර්ථකත්වයට දායකවීමට හැකි වූයේ කණ්ඩායමක් ලෙස අපගේ උපරිම ශක්තියෙන් කටයුතු කිරීම නිසාය.

කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ රට මුහුණ දී සිටින අවදානම් තත්ත්වය තුළ පවා නිෂ්පාදන අංශය ක්‍රියාත්මක වෙමින් ආයතන අවශ්‍යතා සහ රජයේ ප්‍රචාරණ කාර්යයන් වෙනුවෙන් උපරිම දායකත්වය දැක්වීමට ක්‍රියා කලෙමු.

නිෂ්පාදන අංශය තවදුරටත් ශක්තිමත් සහ කාලීන දැනුමින් මෙන්ම තාක්ෂණයෙන් සන්නද්ධව කැපවීමෙන් ඉදිරිගාමීව කටයුතු කිරීමට සූදානමින් සිටී.

මූල්‍ය අංශය

2020 වර්ෂය කොරෝනා වසංගතය සමග ආරම්භ වුවද, සැලසිනෙ ආයතනයේ අප අංශය වඩාත් කාර්යක්ෂම ලෙස ගිණුම් කටයුතු කරගෙන යෑමට අවශ්‍ය පියවර ගන්නා ලදි. විවිධ දුෂ්කරතා හා බාධක පැමිණියද මෙම වසරේ සියළු ගෙවීම් කටයුතු සඳහා අවශ්‍ය බැරකම් පිළිබඳව නොපමාව පරිගණක ගත කිරීමට පියවර ගන්නා ලදි. පසුගිය වසරට සාපේක්ෂව 2020 වසරේ දී ගිණුම් කටයුතු යථා තත්වයට ගෙන ඒමට වැඩි වෙහෙසක් දැරීමට සිදු විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සියලුම ගිණුම් කටයුතු සිදු කරනු ලැබීය. ගෙවිය යුතු ණය මුදල් රාශියක් සැපයුම්කරුවන් වෙත නියමිත පරිදි ගෙවීමට හැකිවිය. ලැබිය යුතු හිඟ මුදල් ලබා ගැනීමේ වැඩපිළිවෙලක් ද සකස් කෙරුණි.

එමෙන්ම, ගිණුම් වාර්තා සැකසීම, තොරතුරු අමාත්‍යංශය හා විගණනය වෙත කඩිනමින් ලබා දීම, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ඇතුළු පාර්ශවයන් වෙත තොරතුරු කඩිනමින් ලබා දීමට පියවර ගනු ගන්නා ලදි. 2014, 2015, 2016, 2017, 2018, 2019 යන වර්ෂවලදී මෙන්ම නැවත වරක් 2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පෙන්නුම් කරන බව විගණකාධිපති මතයක් පල කිරීම සැලකිය යුතු ජයග්‍රහණයක් බව සඳහන් කළ යුතුය.

ඉසව් කළමනාකරණ අංශය

සැලසිනෙ රූපවාහිනී ආයතනයේ ඉසව් අංශය ආයතනයේ ආදායම් ඉපයීම උදෙසා නොමඳ දායකත්වයක් ලබා දෙන සක්‍රීය අංශයක් බවට මේ වන විට පත්ව තිබේ. තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් නැවුම් දැක්මක් සහිතව ඉසව් කළමනාකරණයට නම්‍යවාදී මානයක් ඇති කිරීමට මෙම අංශය සමත්ව තිබෙනවා. මෙම අංශය ආරම්භ කල වසරේ සිට අඛණ්ඩව විශාල ආදායමක් ඉපයූ මෙම අංශය මෙම වසරේ දී පසුගිය වසර මෙන්ම ඉතා අභියෝගාත්මක ගැටලු රැසකට මුහුණ දුනි. මෙම වසරේ දී අප ආයතනය වෙතින් සිදු කිරීමට සැලසුම් කර තිබූ ඉසව් රැසක් පවතින කොවිඩ් 19 වසංගතය හා සෞඛ්‍ය අංශය මගින් ඉදිරිපත් කර ඇති මාර්ගෝපදේශයක් හේතු කොටගෙන අවලංගු විය. විටින් විට හා පූර්ණ වශයෙන් රට වසා දැමීම හා සංචරන සීමා මෙන්ම සෞඛ්‍ය නීති රීති වලට ගරු කරමින් අප ආයතනය ද ඉසව් සංවිධානය කිරීමේ කටයුතු සිදු නොකිරීමට වග බලා ගන්නා ලදි.

කෙසේ වෙතත් ඉසව් කළමනාකරණ අංශය මගින් බාධක හමුවේ ද රු. මිලි. 1.6 ක ආදායමක් ආයතනය වෙත උපයා දීමට හැකි වී ඇත.

මූල්‍ය වාර්තාව 2021

ආදායම් වර්ධනය



පසුගිය වසර පහ තුළ ආදායම් සහ සෘජු වියදමෙහි ප්‍රවණතාවය



2017 - 2021 වසර අතර ආයතනික ලාභයේ උපනතිය

පසුගිය වසර පහ තුළ ආදායම් සහ දළ ලාභයෙහි උපනතිය



ශේෂ පත්‍රය

2021 දෙසැම්බර් මස 31 දිනට ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම නොවන			
දේපළ පිරියත හා උපකරණ	02	16,236,593	6,816,245
අස්පෘෂ්‍ය වත්කම්	02-A	1,607,011	2,257,876
මුළු ජංගම නොවන වත්කම්		**17,843,604**	**9,074,121**
ජංගම			
ආයෝජන	03	9,620,988	33,519,646
වෙළඳ හා ලැබිය යුතු වත්කම්	04	385,426,257	300,440,528
වෙනත් ලැබිය යුතු දෑ	05	1,756,187	9,965
මුදල් හා සමාන දෑ	06	21,354,358	7,542,890
ජංගම වත්කම්		**418,157,790**	**341,513,029**
මුළු වත්කම්		**436,001,394**	**350,587,147**
ස්කන්ධ හා වගකීම්			
ස්කන්ධය			
රඳවාගත් ලාභය / අලාභය		92,386,368	99,105,138
මුළු ස්කන්ධය		**92,386,368**	**99,105,138**
වගකීම්			
ජංගම නොවන			
උපචිත පාරිතෝෂික දීමනා	07	17,638,518	16,724,135
මුළු ජංගම නොවන වගකීම්		**17,638,518**	**16,724,135**
ජංගම			
වෙළඳ හා ගෙවිය යුතු වෙනත් වියදම්	08	325,773,330	234,628,323
අත්තිකාරම් ලැබීම්		203,178	129,552
මුළු ජංගම වගකීම්		**325,976,508**	**234,757,875**
මුළු ස්කන්ධ හා වගකීම්		**436,001,394**	**350,587,147**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වාදෙන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා 1971 අංක 38 දරණ මූල්‍ය පනතට අනුකූලව පිළියෙල කර ඇත.

සාමාන්‍යාධිකාරී - සැලසිනෙ රූපවාහිනී ආයතනය

මෙම මූල්‍යමය ප්‍රකාශය සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත අත්සන් තබන ලදී.

සභාපති
සැලසිනෙ රූපවාහිනී ආයතනය

ආදායම් ප්‍රකාශය

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම්	**09**	**463,180,114**	**233,865,842**
සෘජු පිරිවැය	**10**	342,887,864	189,135,680
දළ ලාභය / අලාභය		**120,292,250**	**44,730,162**
වෙනත් මෙහෙයුම් ආදායම්	**11**	3,013,539	6,574,534
පරිපාලන හා ආයතන වියදම්	**12**	(105,265,782)	(68,760,032)
විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	**13**	(16,325,262)	(10,891,597)
මෙහෙයුම් කටයුතු වලින් ලද ලාභය		**1,714,745**	**(28,346,933)**
මූල්‍ය වියදම්	**14**	(234,155)	(116,795)
වෙනත් වියදම්	**15**	(8,321,592)	(875,865)
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය/අලාභය		**(6,841,002)**	**(29,339,593)**
ආදායම් බදු		-	-
බදු හර කිරීමට පසු ශුද්ධ ලාභය/අලාභය		**(6,841,002)**	**(29,339,593)**

ස්කන්ධ ප්‍රාග්ධන වෙනස්වීම

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

2021 ජනවාරි 1 දිනට ශේෂය		**99,105,138**
වාර්ෂික ගැලපීම්	17	122,232
		99,227,370
වර්ෂය සඳහා ශුද්ධ ලාභය / අලාභය		(6,841,002)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**92,386,368**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2021 රු.	2020 රු.
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහය		
බදු හර කිරීමට පෙර ශුද්ධ ලාභය	(6,841,002)	(29,339,593)
ගැලපීම්;		
පොලී ආදායම්	(1,857,849)	(4,006,227)
දේපල පිරියත හා උපකරණ මත ක්ෂය වෙන්කිරීම්	3,377,770	2,930,251
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	2,652,247	2,656,623
අඩමාන ණය වෙන්කිරීම්	-	(1,181,255)
පසුගිය වර්ෂයට අදාළ ගැලපීම්	122,232	3,942,030
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**(2,546,602)**	**(24,998,170)**
වෙළඳ හා අනෙකුත් ලැබීම් (වැඩිවීම් / අඩුවීම්)	(84,985,729)	94,508,497
තැම්පත් සහ කලින් කල ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	(1,746,222)	1,659,931
වෙළඳ ණය හිමියෝ හා අනෙකුත් ගෙවීම් (වැඩිවීම් / අඩුවීම්)	91,145,007	(91,721,340)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්	73,626	-
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල්	**1,940,081**	**(20,551,082)**
පාරිතෝෂික ගෙවීම්	(1,737,865)	(2,314,195)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**202,216**	**(22,865,277)**
ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල්		
දේපල පිරියත, යන්ත්‍රා හා උපකරණ මිලදී ගැනීම්	(12,147,253)	(276,259)
පොලී ආදායම්	1,857,849	4,006,227
ස්ථාවර තැම්පතු	23,898,658	(1,121,446)
ආයෝජන කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**13,609,254**	**2,608,522**
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
අඩමාන ණය වෙන් කිරීම	-	-
රඳවාගත් ඉපැයීමේ දෝෂ නිවැරදි කිරීම	-	113,152
මූල්‍ය කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	**-**	**113,152**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම / අඩුවීම	**13,811,468**	**(20,143,603)**
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	7,542,890	27,686,494
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ (සටහන් A)	**21,354,358**	**7,542,890**
සටහන A		
මුදල් හා මුදල් සමාන දෑ		
ලංකා බැංකුව ජංගම ගිණුම් අංකය - 2323299	3,540,148	1,323,361
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගිණුම් අංකය - 2329765	156,471	326,584
මහජන බැංකුව 200100130005980	(9,870,147)	(18,227,500)
මහජන බැංකුව 200100110005980	26,817,817	23,638,167
නිෂ්පාදන අත්තිකාරම්	434,909	276,209
අනෙකුත් අත්තිකාරම්	275,160	206,070
	21,354,358	**7,542,890**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ගිණුම් ප්‍රතිපත්ති

1. පොදු කරුණු

1.1 සංයුක්ත තොරතුරු

සැලසිනෙ රූපවාහිනී ආයතනය (මින් පසු සැලසිනෙ නාමයෙන් හැඳින්වෙන) 2019.02.26 වෙනි දිනැති අංක 2112/13 දරන විශේෂ ගැසට් නිවේදනය මඟින් ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි විෂය පථයට ඇතුළත් කෙරිණි.

1.2 මූලික කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රමාණය

ප්‍රචාරණය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මෙන්ම ඉසව් කළමනාකරණය සැලසිනෙහි මූලික කාර්යයන් අතර ප්‍රධාන තැනක් ගනී.

1.3 සේවක ප්‍රමාණය

2021.12.31 වන දිනට 53 ක සේවක ප්‍රමාණයක් සිට ඇත.

2. ගිණුම් ප්‍රතිපත්ති පිළිබඳව සුවිශේෂී කරුණුවල සාරාංශය

2.1 පොදු ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කර ඇත්තේ පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මග පෙන්වීම යටතේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ය. ශ්‍රී ලංකා රුපියල් වලින් මෙම මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති අතර, දිගින් දිගටම පවත්වා ගැනීමේ පදනම මත ඉදිරිපත් කර ඇත.

2.2 ස්ථායීතාවය සහ සැසඳුම්

මෙම වසර සඳහා යොදා ගන්නා ලද ගිණුම් ප්‍රතිපත්ති පසුගිය වසරේ දී යොදා ගත් ප්‍රතිපත්ති සමග අනුකූල වේ.

2.3 ණය පිරිවැය

මෙම ණය පිරිවැය හඳුනාගෙන ඇත්තේ අදාළ ගිණුම් කාලය තුළ දරන ලද වියදම් ලෙස ය.

3. වත්කම් තක්සේරුව සහ එහි ඇගයුම් පදනම

3.1 දේපල පිරියත සහ උපකරණ

පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මත දේපල, පිරියත සහ උපකරණ පිළිබඳ වාර්තා සකස් කර ඇත.

3.2 වෙළඳ සහ ලැබිය යුතු දෑ

වෙළඳ සහ ලැබිය යුතු වෙනත් දෑ ඇස්තමේන්තු කළ උපලබ්ධි අගය මත සඳහන් කර ඇත.

3.3 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු කෙටිකාලීන ඉහළ ද්‍රව ශීලතාවය ඇති ආයෝජන මෙයට ඇතුළත් වේ.

3.4 ක්ෂය කිරීම

ආදායම් ප්‍රකාශය තුළ ක්ෂය වීම් ලෙස හඳුන්වනු ලැබුණේ ප්‍රයෝජනයට ගත හැකි යැයි ඇස්තමේන්තු ගතකර තිබෙන වත්කම් පදනම් කරගත් සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි. මූල්‍ය කල්බදු යටතේ පවතින කෙටිකාලීන හා ප්‍රයෝජනයට ගත හැකි සමාන වටිනාකම් සහිත වත්කම් මත ක්ෂය කිරීම් සිදු කර ඇත.

එක් එක් අයිතමයන්ගේ ක්ෂය අනුපාතයන් පහත පරිදි වන අතර, එහි පවත්නා ඇස්තමේන්තු ඵලදායී කාලය සහ සාපේක්ෂ කාලය පහත පරිදි වේ.

ලී බඩු සහ සවිකිරීම්	වර්ෂ 10
පරිගණක උපකරණ	වර්ෂ 05
කාර්යාලයීය උපකරණ	වර්ෂ 10
මෝටර් වාහන	වර්ෂ 05
කැමරා සහ චිත්‍රපට උපකරණ	වර්ෂ 10
පරිගණක මෘදුකාංග	වර්ෂ 10

3.5 ස්ථාවර වත්කම් බැහැර කිරීම

2018 වසරේ වත්කම් මිලදී ගැනීම හඳුනා නොගෙන බැහැර කර ඇත.

4. වගකීම් සහ ප්‍රතිපාදන

4.1 වගකීම් වර්ගීකරණය වන්නේ ඉල්ලුම මත ගෙවීමට බැඳී සිටින පවත්නා ශේෂ පත්‍රයේ වගකීම් හෝ ශේෂ පත්‍ර දින සිට වසරක කාලයක් තුළ ය. ශේෂ පත්‍ර දින සිට වසරක කාලයකට පසුව ගෙවීමට නියමිත වගකීම් ලෙස අයිතම වර්ගීකරණය වී ඇත.

4.2 විශ්‍රාම සහ ප්‍රතිලාභ දීමනා

සේවක ප්‍රතිලාභ - LKAS 19 (සංශෝධිත 2006) විධිවිධානයන් යටතේ සියලු සේවකයන්ගේ විශ්‍රාමික ප්‍රතිලාභ සේවයේ පළමු වසරේ සිටම ප්‍රතිපාදනය කර ඇත.

1983 අංක 12 දරන ප්‍රතිලාභ දීමනා පනතට අනුකූලව වී යටතේ වසර 05 ක් එක දිගට පවත්වාගෙන ගොස් සේවය අවසන් කරන්නා වූ සේවකයින් සඳහා වන වගකීමක් ලෙස ප්‍රතිපාදන වෙන් කර ඇත.

4.3 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

ව්‍යවස්ථාව සහ රෙගුලාසිවලට සමගාමීව සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයට සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයට සුදුසුකම් ලබනු අතර, ආයතනය විසින් 15% ක සහ 3% ක් සේවකයින්ගේ මුළු වේතන ප්‍රමාණයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායක වේ.

5 ආදායම් ප්‍රකාශය

5.1 පිරිවැටුම

සැලසිනෙ පිරිවැටුම ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ, මුද්‍රණ, පුවත්පත් වෙළඳ දැන්වීම් උපලේඛනගත කිරීම්, ඉසව් කළමනාකරණ, සමාජ මාධ්‍ය, රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් නිෂ්පාදනය තුළින් ලැබේ.

5.2 ආදායම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ සසම්භාවී ලෙස ගලා ඒමේ ප්‍රමාණය සහ ආදායම් විශ්වාසී ලෙස ගණනය කිරීම ආදායම් හඳුනා ගැනීම ලෙස හැඳින්වේ.

5.3 වියදම් හඳුනා ගැනීම

වියදම් හඳුනා ගැනීම ආදායම් ප්‍රකාශනයේ සෘජු සම්බන්ධතාවය අතර පිරිවැය සහ විශේෂී අයිතම සඳහා වූ ආදායම් ඉපැයුම් පදනම මත වියදම් හඳුනා ගැනීම සිදු කරනු ලැබේ.

6. අදාළ පාර්ශව අතර ගනුදෙනු

LKAS 24 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන කාලය තුළ අදාළ පාර්ශව අතර ගනුදෙනු කිසිවක් සිදුකර නොමැත.

7. ශේෂ පත්‍ර දිනයට සිදුවීම් වලට අදාළ පසු ගැලපුම් සටහන්

7.1 මූල්‍ය වාර්තාවෙහි හෙලිදරව් කළ යුතු හෝ ගැළපීම් කළ යුතු ප්‍රමාණාත්මක සිදුවීම් ශේෂ පත්‍ර දිනට පසු සිදු වී නොමැත.

8. ණයගැතියන් සඳහා අඩමාණ ණය ලෙස 5 % ක් වෙන්කර තිබේ. (දින 90 ට වැඩි ණයගැතියන් සඳහා)

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

සටහන් - 02 දේපල පිරියත හා උපකරණ

	01.01.2021 දිනට පිරිවැය රු.	එකතු කිරීම් / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු.	31.12.2021 දිනට පිරිවැය රු.
02.1 දළ වත්කම්				
ලීබඩු සහ සවිකිරීම්	3,598,752	7,524,358	24,882	11,098,227
පරිගණක උපාංග	8,607,951	2,586,388	345,000	10,849,339
කාර්යාල උපකරණ	5,797,882	2,093,155	203,600	7,687,437
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	15,148,200	20,800	-	15,169,000
	40,988,609	**12,224,700**	**573,482**	**52,639,827**

	01.01.2021 දිනට ශේෂය රු.	වර්ෂය සඳහා ක්ෂය / මාරු කිරීම් රු.	ඉවත් කිරීම් / මාරු කිරීම් රු.	31.12.2021 දිනට ශේෂය රු.
02. 2 ක්ෂයවීම්				
ලී බඩු සහ සවිකිරීම්	2,450,838	475,313	15,277	2,910,875
පරිගණක උපාංග	7,575,814	638,022	345,000	7,868,836
කාර්යාල උපකරණ	3,697,282	464,606	135,758	4,026,130
මෝටර් රථ	7,835,824	-	-	7,835,824
කැමරා සහ උපකරණ	12,612,606	1,148,963	-	13,761,569
	34,172,364	**2,726,905**	**496,035**	**36,403,234**
	6,816,245			**16,236,593**
සටහන - 02-A අස්පෘශ්‍ය වත්කම්				
ගිණුම්කරණ මෘදුකාංග	3,389,000	-	-	3,389,000
ජාලකරණ මෙහෙයුම්	3,419,651	-	-	3,419,651
	6,808,651	**-**	**-**	**6,808,651**
ක්‍රමක්ෂය				
ගිණුම්කරණ මෘදුකාංග	2,243,669	308,900	-	2,552,569
ජාලකරණ මෙහෙයුම්	2,307,106	341,965	-	2,649,071
	4,550,775	**650,865**	**-**	**5,201,640**
	2,257,876			**1,607,011**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2021 රු.	2020 රු.
සටහන - 03 - ආයෝජන			
ලංකා බැංකුව - ගිණුම් අංකය 8162593		500,000	500,000
ණයකර - ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව		398,200	398,200
ලංකා බැංකුව - ගිණුම් අංකය 83636019		7,000,000	7,000,000
මහජන බැංකුව - ගිණුම් අංකය 2006001000052421		-	8,000,000
මහජන බැංකුව - B-581908		-	5,000,000
ලංකා බැංකුව - ගිණුම් අංකය 84622785		1,722,788	1,635,753
මහජන බැංකුව - ගිණුම් අංකය 2006-00100005485-7		-	10,985,693
		9,620,988	**33,519,646**
සටහන - 04 - වෙළඳ හා ලැබිය යුතු දෑ			
වෙළෙඳ ණය ගැතියෝ	**04.1**	334,299,970	276,719,441
සේවක ණයගැතියෝ	**04.2**	2,512,241	2,609,342
අත්තිකාරම් මුදල් ගෙවීම්		23,741,000	-
ලැබිය යුතු රක්ෂණ වාරික		41,800	210,030
රඳවා ගැනීමේ බදු		82,459	82,459
ආර්ථික සේවා ගාස්තු		3,599,744	3,599,744
උපාලි පුවත්පත් සමාගම		10,695	10,695
ලැබිය යුතු දඩ හා අධිභාර		194,068	194,068
එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම		2,538,029	2,538,029
විජය පුවත්පත් සමාගම		188,651	188,651
ඊ.ඒ.පී		3,004	3,004
ලැබිය යුතු කොමිස් මුදල - ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව		63,558	63,558
ආපසු ගෙවන තැන්පතු		5,639,100	1,246,000
ලැබිය යුතු බැංකු පොලී ආදායම්		92,870	556,439
සේවක මුදල් වංචාව	**04.2**	11,988,000	11,988,000
විවිධ ලැබීම්		63,151	63,151
ඊ-මංසල පාලන ගිණුම		367,917	367,917
		385,426,257	**300,440,528**
සටහන - 04.1 - වෙළෙඳ ණයගැතියෝ			
වෙළෙඳ ණයගැතියෝ		347,262,234	288,956,004
අඩු කලා - ණයගැති ලැබීම්		(755,273)	-
අඩු කලා - බොල් ණය සඳහා වෙන් කිරීම්		(12,206,991)	(12,236,563)
		334,299,970	**276,719,441**
සටහන - 04.2 - සේවක ණයගැතියෝ			
උත්සව අත්තිකාරම්		20,000	57,500
සේවක ණය		2,118,756	2,323,563
සේවකයන්ගෙන් ලැබිය යුතු වෙනත්		23,021	228,279
සේවක රක්ෂණ		350,464	-
		2,512,241	**2,609,342**

සටහන - 04.3 - සේවක මුදල් වංචාව

ආයතනයේ සේවකයන් විසින් නිසි අධිකාරියකින් තොරව මුදල් ලබාගෙන කරන ලද මූල්‍ය වංචාව පිලිබඳව පොලිස් මූල්‍ය අපරාධ අංශය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම මුදල් අදාල පාර්ශ්වයන්ගෙන් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු කරගෙන යනු ලැබේ.

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	සටහන්	2021 රු.	2020 රු.
සටහන - 05 - කලින් ගෙවීම් සහ වෙනත් ලැබීම්			
කලින් ගෙවීම්		1,756,187	9,965
		1,756,187	**9,965**
සටහන - 06 - මුදල් මුදල් සමාන දෑ			
ලංකා බැංකුව ගි.අ. 2323299		3,540,148	1,323,361
ලංකා බැංකුව ඉතිරි කිරීමේ ගි.අ. 2329765		156,471	326,584
මහජන බැංකුව (ජංගම) ගි.අ. 200100130005980		(9,870,147)	(18,227,500)
මහජන බැංකුව (ඉතිරි කිරීමේ) ගි.අ. 200100110005980		26,817,817	23,638,167
නිෂ්පාදන අත්තිකාරම්		434,909	276,209
වෙනත් අත්තිකාරම්		275,160	206,070
		21,354,358	**7,542,890**
සටහන - 07 - ගෙවිය යුතු පාරිතෝෂික			
ඉ / ගෙ ශේෂය		16,724,136	16,381,701
පාරිතෝෂික වියදම් වර්ෂය සඳහා		2,652,247	2,656,623
		19,376,383	19,038,330
පාරිතෝෂික ගෙවීම්		(1,737,865)	(2,314,195)
ගෙවිය යුතු පාරිතෝෂික		**17,638,518**	**16,724,135**
සටහන - 08 - වෙළෙඳ හා අනිකුත් ගෙවිය යුතු දෑ			
වෙළෙඳ ණයහිමියෝ		208,337,990	144,622,909
දුරකතන ගාස්තු		47,303	47,303
ගෙවිය යුතු අලෙවි කොමිස්		1,934,634	160,535
උපචිත මුද්දර ගාස්තු		22,225	8,150
චිකතුකල අගය මත බද්ද		32,300,238	17,957,045
ජාතිය ගොඩනැගීමේ බද්ද		24,437,590	24,435,590
ගෙවිය යුතු ගෙවල් කුළී		900,000	900,000
වෙනත් ණය හිමියෝ හා වෙනත් ගෙවීම්		21,578,759	5,822,295
ඉන්ධන		41,651	41,651
වැටුප් පාලන ගිණුම		127,766	66,537
අවිනිශ්චිත ගිණුම		10,353	10,353
පාලන ගිණුම - Vision 2020 President Secretariat		616,896	616,896
උපචිත වියදම්		35,347,925	39,869,057
ආපසු ගෙවන තැන්පතු		70,000	70,000
		325,773,330	**234,628,323**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2021 රු.	2020 රු.
සටහන - 09- ආදායම්		
නිෂ්පාදන	87,521,891	9,806,794
ග්‍රැෆික් සහ මුද්‍රණ කටයුතු	90,719,565	32,036,158
උපලේඛනගත කිරීම්	279,826,429	178,035,799
ඉසව් කළමනාකරණය	1,939,515	13,957,091
සමාජ මාධ්‍ය/ වෙබ්/ වෙනත් ආදායම්	3,172,714	30,000
	463,180,114	**233,865,842**
සටහන - 10 - සෘජු පිරිවැය		
නිෂ්පාදන වියදම්	86,491,533	5,585,569
ග්‍රැෆික් හා මුද්‍රණ වියදම්	76,793,094	23,800,111
උපලේඛනගත වියදම්	157,440,346	147,427,101
ඉසව් කළමනාකරණ වියදම්	1,610,000	12,322,899
සමාජ මාධ්‍ය වියදම්	1,117,000	-
නිර්මාණාත්මක නියෝජිත ආයතන කොමිස්	19,435,891	
	342,887,864	**189,135,680**
සටහන - 11 - වෙනත් ආදායම්		
සේවක ණය පොළී	96,120	96,068
බැංකු පොළී	1,761,729	3,910,159
අඩමාන ණය අධි වෙන් කිරීම්	29,572	1,181,255
ආපසු නොගෙවනු තැන්පතු	17,000	-
වත්කම් විකිණීමේ (ලාභය/අලාභය)	-	13,900
වෙනත් ආදායම්	86,118	582,152
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම්	921,500	606,000
නිර්මාණ ශාස්තු	101,500	185,000
	3,013,539	**6,574,534**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2021 රු.	2020 රු.
සටහන - 12 - පරිපාලන හා ආයතන වියදම්		
වැටුප් හා වේතන	41,327,530	42,788,007
සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල	5,941,358	6,045,399
සේවක අර්ථ සාධක අරමුදල	1,188,988	1,209,394
දීමනා	328,991	271,661
දීමනා - සභාපති	1,569,402	552,000
දීමනා - කොන්ත්‍රාත් සේවාවන්	301,507	-
දීමනා - පුහුණු	124,000	96,250
දීමනා - ප්‍රවාහන	443,540	600,000
දීමනා - ඉන්ධන	540,728	231,560
දීමනා - දුරකතන	1,624,333	-
සේවක අතිකාල සහ යැපීම් දීමනා	8,595,612	1,285,809
ගීණුම් ගාස්තු	340,000	204,000
විගණන ගාස්තු	200,000	-
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම්	10,570	-
දීමනා - අධ්‍යක්ෂක මණ්ඩල	255,000	-
ටෙන්ඩර් කමිටු සහ තාක්ෂණික කමිටු සමාජික ගාස්තු	409,500	10,000
ප්‍රසාද දීමනා	1,155,000	-
ගොඩනැගිලි වියදම්	7,779,000	-
ගොඩනැගිලි කුළී වියදම් - ජාතික චිත්‍රපට සංස්ථාව	3,780,000	3,780,000
ගොඩනැගිලි කුළී වියදම්	2,700,000	-
පිරිසිදු කිරීමේ හා සනීපාරක්ෂක වියදම්	34,550	18,800
පරිගණක උපාංග අලුත්වැඩියා වියදම්	42,350	23,150
ක්ෂය වීම්	2,726,904	2,353,443
විදුලිය	748,303	637,050
පාරිතෝෂික දීමනා	2,652,247	2,656,623
නිවාස කූලි	360,000	-
අන්තර්ජාල වියදම්	342.234	283,750
කම්කරු වියදම්	34,500	1,000
පුවත්පත් මිලට ගැනීමේ වියදම්	81,210	52,460
කාර්යාලීය උපකරණ අලුත්වැඩියා වියදම්	588,366	160,152
කාර්යාල නඩත්තු වියදම්	4,144,647	222,493
තැපැල් ගාස්තු	8,150	21,164
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	2,124,448	822,990

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2021 රු.	2020 රු.
ගිවිසුම් අලුත්කිරීමේ ගාස්තු	32,500	-
ලියාපදිංචි ගාස්තු	162,748	132,970
සංග්‍රහ වියදම්	721,078	75,178
ආරක්ෂක සේවා වියදම්	811,356	676,940
සේවක රක්ෂණය	1,040,499	1,796,794
සේවක සුභසාධනය	1,656,264	-
පද්ධති නඩත්තු කිරීමේ වියදම්	120,690	17,000
දුරකතන ගාස්තු	424,776	384,265
ටෙන්ඩර් ගාස්තු		58,100
පුහුණු කිරීමේ වැඩසටහන්	619,050	179,875
පුහුණු කිරීම් හා සංවර්ධන වැඩසටහන්	200,000	-
පරිවර්තන ගාස්තු	-	391,973
වාහන කූලි	6,600,398	-
ජල වියදම්	281,175	128,803
වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ වියදම්	74,400	590,978
වෙනත් වියදම්	17,880	-
	105,265,782	**68,760,032**

සටහන - 13 - විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්

ඉන්ධන වියදම්	2,557,319	392,409
මෝටර්රථ වාහන අළුත්වැඩියා වියදම්	1,273,827	433,847
අලෙවි දිරි දීමනා	3,782,682	237,545
අලෙවි ප්‍රවර්ධන හා ප්‍රචාරණ වියදම්	1,548,072	37,176
විශේෂ වට්ටම්	3,891,987	9,572,901
ණය අයකර ගැනීමේ විශේෂ වියදම්	-	3,000
මුද්දර ගාස්තු	494,106	25,700
ප්‍රවාහන, ගමන් ගාස්තු හා නවතා තැබීමේ ගාස්තු	2,666,299	107,737
වාහන රක්ෂණ	62,530	81,282
ටෙන්ඩර් ගාස්තු	48,440	-
	16,325,262	**10,891,597**

සටහන - 14 - මූල්‍ය වියදම්

බැංකු ගාස්තු	228,797	101,154
බලපත්‍ර හා රක්ෂණ ගාස්තු	5,358	15,641
	234,155	**116,795**

මූල්‍ය වාර්තා සඳහා සටහන්

2021 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා මුදලින් දක්වන ලදී

	2021 රු.	2020 රු.
සටහන - 15 - වෙනත් වියදම්		
ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති වියදම්	5,818,520	-
ගිණුම්කරණ මෘදුකාංග - ක්‍රමක්ෂය	308,900	308,900
ජාලකරණ මෙහෙයුම් - ක්‍රමක්ෂය	341,965	341,965
වත්කම් විකිණීම් / පාඩුව	77,448	-
නෛතික වියදම්	1,150,403	225,000
අධිභාර	164,035	-
පරිත්‍යාග	420,000	-
වෙනත් වියදම්	40,321	-
	8,321,592	**875,865**

සටහන - 16 - සම්බන්ධිත පාර්ශවයන් හෙලිදරව් කිරීම (LKAS 24)

නම	තනතුර	සම්බන්ධතා පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ ස්වභාවය	ලිපිනය
එම්. එම්. ඒ. යූ. බී. මොරේමඩ	සභාපති	වැටුප් හා වේතන 2,091,602	අංක.703/2/2/E වික්‍රමසිංහ පටුමග, කුලසෙවන පාර, කොට්ටාව
මංජුල හේරත්	සාමාන්‍යාධිකාරී	වැටුප් හා වේතන 1,300,320	අංක. 52, කොම්පෙයාහේන පාර, හෝමාගම.

2021 මුදල් වර්ෂය සඳහා සැලසිනෙ රූපවාහිනී ආයතනය සහ ඉහත දැක්වෙන එක් එක් පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමඟ සම්බන්ධතා පාර්ශව ගනුදෙනු සිදුනොවීය.

සටහන - 17 - පෙර වර්ෂයේ ගැලපීම්

උපචිත වියදම් ගිණුම නිවැරදි කිරීම	(43,089)
ණයහිමි ශේෂ නිරවුල් කිරීම	165,321
	122,232

සටහන - 18 - ගොඩනැඟිලි අලුත්වැඩියා වියදම්

කල්බදු ගිවිසුමේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ කල්බදු සීමාව වන වසර 05 ක කාලය තුල ආයතනය විසින් ප්‍රාග්ධන ස්වභාවයක් ගන්නා ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් කපා හරිනු ඇත.

2021 වසරේ මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳව විගණකාධිපතිතුමාගේ මතය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : සිඒඑම්/බී/සැලසිනේ/1/එෆ්ඒ/2021
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2023 මැයි 25 දින

සභාපති,

සැලසිනේ රූපවාහිනී ආයතනය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන වගන්තිය අනුව සියළුම දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී ම කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර පිරිවැය රු.19,321,400 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ දැනට භාවිතයේ පැවතුණි. එම ප්‍රමිතියෙහිම 79හි(b) වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ වල දල ධාරන අගය මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කල යුතු වුවත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු ඉතිරිකිරීමේ ගිණුමක ශේෂය රු.26,817,817ක් වුවද බැංකුව විසින් එවන ලද තහවුරු ලිපිය අනුව ශේෂය රු.27,483,194 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන එම ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය රු.665,377 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවියයුතු එකතුකළ අගය මත බදු වගකීම රු. 32,300,288ක් වුවද, විගණනයට ලද තොරතුරු අනුව කරන ලද ගණනය කිරීම් වටිනාකම රු.28,884,905ක් වූයෙන් රු.3,415,333 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) ආයතනය රටවැසි යුතුකම නමින් සමාජ සේවා කටයුතු සඳහා වර්ෂය තුළ රු.10,668,520 ක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට උපචිත වියදම රු.4,850,000 ක් වී තිබුණි.එම වටිනාකම ගිණුම් වලට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් සහ වර්ෂයේ අලාභය රු.4,850,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2014 වර්ෂයේ ආයතනයේ සිදු වී ඇති රු.11,988,000ක් වූ සේවක මුදල් වංචාව එය සිදු වී වසර 9 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ඒ පිළිබඳ කිසිදු නඩු කටයුත්තක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන වාර්තාවක් පමණක් පවතින අවිනිශ්චිත තත්වයක් යටතේ එම ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා ලැබිය යුතු දෑ තුළ දක්වා තිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් එකතු වටිනාකම රු.279,912,547 ක් වූ ආදායම් ශේෂයන් 02ක් සහ රු.167,685,530ක් වූ වියදම් ශේෂයන් 04ක් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබීම හා ශේෂ පිරික්සුම් තුළින් ශේෂය නිශ්චිතව හඳුනා ගැනීම ගැටළු සහගත වූ බැවින් එම ශේෂවල නිවැරදිතාවය විගණනය වෙත තහවුරු නොවුණි.

(උ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1)(අ) වගන්තිය ප්‍රකාරව යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළහැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබියයුතු වුවත් 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ 3(1) වගන්තියට අනුව යම් පුද්ගලයෙකු විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු එම පුද්ගලයා විසින් අදාළ තක්සේරු වර්ෂයේ අදාල කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් හිලව් කල හැකි වේ.එසේ වුවද ආයතනය ආරම්භ කරන ලද 1982 වර්ෂයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබුනු පසුබිමක වර්ෂ 10 කට ආසන්න කාලයක සිට රු. 3,599,744 ක ශේෂයක් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(එ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ හා ලැබියයුතු ශේෂ සහ වෙළඳ හා ගෙවියයුතු ශේෂ වලට අදාළ ණයගැති හා ණයහිමි ආයතන වල මූල්‍ය ප්‍රකාශනයන්හි ශේෂ සමඟ සැසඳීමේදී, ආයතන 03කින් ලැබියයුතු ශේෂය රු.4,465,542ක් ද ආයතනයකින් ලැබියයුතු ශේෂය රු.326,518ක් ද ආයතන 03කට ගෙවියයුතු ශේෂ රු.7,866,360 ක් ද වෙනස් අගයන්ගෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3. ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව,ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව/ පහත සඳහන් නිරීක්ෂණ හැර අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	වටිනාකම රු.	නිරීක්ෂණ
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2)(ආ) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක PED/RED/01/01/2020/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2,432,000	යම් විශේෂිත කාර්යයන් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිමය එක් අවස්ථාවකදී රු.100,000 නොඉක්මවිය යුතු වුවත් එම සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා එක් නිශ්චිත කාර්යයක විවිධ කොටස් සඳහා වෙන වෙනම අත්තිකාරම් ලබා දී තිබුණු අතර අවස්ථා 16කදී රු.2,432,000ක් ඵලෙස උපරිම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදී තිබුණි.
(ආ) 2021 දෙසැම්බර් 15 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ	812,000	පෙර වර්ෂයට සාපේක්ෂව අලාභය අඩු කරවාගෙන ඇති රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා ගෙවියහැකි ප්‍රසාද දීමනාව රු.5000ක් වුවද 2021 අප්‍රේල් මාසයේදී එකතුව රු. 812,000ක් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනි අයුරින් සේවකයින් 63 දෙනෙකු සඳහා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

අවශ්‍යතාවයට වඩාත් යෝග්‍ය වන ගොඩනැඟිල්ලක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තෝරාගැනීම වෙනුවට ආයතනය සමාලෝචිත වර්ෂයේදී විශාල අලුත්වැඩියාවන් සිදු කිරීමට පවතින වර්ග අඩි 6850ක ගොඩනැඟිල්ලක් මසකට රු.675,000ක මුදලකට වසර 10ක බදු පදනම මත ලබාගෙන තිබුණි. ගොඩනැඟිල්ලේ හිමිකරු හා ආයතනය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව

නිමකරන ලද වැඩ පරීක්ෂා කිරීමක් සිදුවූ බවට හෝ තවදුරටත් අලුත්වැඩියා කටයුතු අවශ්‍ය වන්නේද යන්න හඳුනාගැනීමකින් තොරව ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 21ක් ද ඊට අතිරේකව රු.මි.8ක් ඉක්මවූ මුදලක් ද වැයකර තිබුණු අතර නැවත අයකරගත හැකි තැන්පතුවක් ලෙස මාස හයක ගොඩනැඟිලි කුලී වටිනාකම රු.4,050,000 ක්ද ගොඩනැඟිලි හිමිකරුට ගෙවා තිබුණි. ඒ සඳහා අවශ්‍ය මුදල් සපයාගැනීම සඳහා ආයතනයේ රු.23,000,000ක ස්ථාවර තැන්පතු තුනක් ඉවත්කරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් ආයතනයට රු. 1,066,424කට ආසන්න පොලී ආදායමක් අහිමි වී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු 39 ක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණු තනතුරු 34 ක් සඳහා ස්ථිර සේවකයින් 06ක්, කොන්ත්‍රාත් සේවකයින් 26 ක් සහ අනියම් පදනම මත සේවකයින් 01 ක් සහ පුහුණු සේවකයින් 01 ක් වශයෙන් බඳවා ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවාදායක ණයගැති ශේෂය රු.347,262,234 ක් වූ අතර ඉන් වසර 4 ඉක්මවා ඇති ශේෂය රු. 190,011,004 ක් හෙවත් මුළු ණයගැති ශේෂයෙන් සියයට 55 ක් වී තිබුණි.එසේම වසරට වඩා වැඩි ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග කිසිවක් ආයතනය ආරම්භයේ සිටම ගෙන නොතිබූ බැවින් 2006 සිට පවතින රු.6,611,743 ක ණය ගැති ශේෂය කාලවරෝධ පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව අවදානමට ලක් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු.347,262,234 ක් වූ මුළු වෙළඳ ණයගැතියන්ගෙන් සියයට 70 ක් හෙවත් රු.243,917,857 ක් මාස 03 ඉක්ම වූ ණයගැතියන්ගෙන් සමන්විත විය.

(ඈ) වර්ෂ 06 ක සිට පැවත එන අය නොවී පැවති ගිණුම් ශේෂ 04ක වටිනාකම වූ රු.2,739,878 ක් අයකර ගැනීමට හා ගෙවිය යුතුව පැවති ගිණුම් ශේෂ 03ක වටිනාකම වූ රු.218,396 ක් ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුල දී ද කටයුතු කර නොතිබුණි.

(ඉ) 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතන වල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකරවා ගැනීමේ බලය ලැබී වසර 10ක් ගතව තිබුණද ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඊ) ගෙවීම් වවුචර, ලෙජර් කාඩ් සමඟ පරීක්ෂා කිරීමේ දී වවුචර අංකය ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය මගින් නොපෙන්වීම හේතුවෙන් ගෙවීම් වවුචර පරීක්ෂාව අපහසු වූ අතර ආයතනය විසින් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකසා ගෙන නොතිබුණි.

(උ) ආයතනය විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් අංක 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැඟිල්ලේ පහළ මාලය අංක 4660 දරණ බදු ගිවිසුම මඟින් 2014 ජනවාරි 15 දින සිට 2019 ජනවාරි 14 දින දක්වා වසර 05ක කාලයකට බදු පදනම යටතේ ලබාගෙන තිබුණි.එසේ වුවද එම බදු කාලය අවසන් වීමෙන් පසුවද 2021 දෙසැම්බර් 31 දින දක්වා එම පරිශ්‍රයේ රැඳී සිට තිබුණු අතර නැවත විධිමත් පරිදි ගිවිසුමකට එළැඹීමට කටයුතු කර නොතිබුණි. ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් 2022.05.25 දිනැතිව සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපති වෙත යොමුකරන ලද අංක NFC/103/04/01 දරණ ලිපිය ප්‍රකාරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාසික ගොඩනැඟිලි කුලී තක්සේරු වාර්තා වලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි කුලී රු. 10,455,000 ක් ගෙවිය යුතු බවට දන්වා තිබුනද, ආයතනය මෙම ගැටළුව විසඳාගැනීමට විධිමත් ලෙස කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

SELACINE TELEVISION INSTITUTE

No. 380/57, Sarana Road, Colombo 07, Sri Lanka.
Telephone : +94-11- 4320777, +94-11-2058227 I Fax : +94-11-2058229 I Email : info@selacine.lk
Website : www.selacine.lk